සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

## Primary Piriven Year End Term Test - 2016

**3 වසර / Grade 3**

**භූගෝල විද්‍යාව**
**Geography**

කාලය : පැය තුනයි
Time: Three hours

❖ **I වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. i. සෞරග්‍රහ මණ්ඩලයට අයත් විශාල ම ග්‍රහයා නම් කරන්න. ..................................................

ii. අහසේ දීප්තිමත්ව දිදුලන ආකාශ වස්තු .................................................. වේ.

iii. ග්‍රහලෝක ආලෝකමත් වන්නේ .................................................. ලැබෙන ආලෝකය පරාවර්තනය වීමෙනි.

iv. පරිසරය ප්‍රධාන කොටස් .................................................. බෙදෙයි.

v. සාගර ජල මට්ටම ඉහළ නැගීම .................................................. නමින් හඳුන්වයි.

vi. පෘථිවිය තමන් වටා කැරකීම .................................................. ලෙස හඳුන්වයි.

vii. පෘථිවිය .................................................. ආනතියකට පිහිටා තිබේ.

viii. ලංකාව උතුරු අක්ෂාංශ .......................................... හා නැගෙනහිර දේශාංශ ...................................... අතර පිහිටා ඇත.

ix. පෘථිවි කබොල .......................................... සහ ...................................... යනුවෙන් ස්ථර දෙකකින් වැසී තිබේ.

x. දේශාංශ දෙකක් අතර කාලයේ වෙනස .......................................... කි.

(ලකුණු 2x10=20)

The National e-learning Portal for The General Education

02. "මිනිසා පරිසරය ජය ගැනීමට යාමෙන් පරිසරය මිනිසාට උරණ වී තිබේ"

i. නූතන පරිසර විනාශයට බලපා ඇති කරුණු හතරක් ලියන්න. (ලකුණු 04)

ii. පරිසරය විනාශවීමේ විපාක තුනක් දක්වා ඒවා කෙටියෙන් පහදන්න. (ලකුණු 06)

iii. පරිසර සංරක්ෂණය සඳහා ගතයුතු ක්‍රියා මාර්ග තුනක් පහදන්න. (ලකුණු 10)

03. "පෘථිවිය සූර්යා වටා ගමන් කිරීම පරිභ්‍රමණය නමින් හඳුන්වයි."

i. පෘථිවි පරිභ්‍රමණයේ ප්‍රතිඵල දෙකක් ලියන්න. (ලකුණු 04)

ii. පිහිටීම අනුව ලෝකයේ රටවල වේලාව වෙනස් වන අයුරු පහදන්න. (ලකුණු 06)

iii. ග්‍රිනිච් වේලාව දහවල් 12.00 වන විට නැගෙනහිර දේශාංශ $60^0$ පිහිටි සවුදි රාජ්‍යයේ වේලාව සොයන්න. (ලකුණු 10)

**04.** "පෘථිවිය සැකසී ඇති ආකාරය පෘථිවි සංයුතිය නමින් හඳුන්වයි."

i. පෘථිවි සංයුතියේ ප්‍රධාන කොටස් නම් කරන්න. (ලකුණු 04)

ii. ලෝකයේ ප්‍රධාන මහද්වීප සහ සාගර කීයද? ඒ මොනවාදැයි වෙන වෙන ම ලියා දක්වන්න. (ලකුණු 06)

iii. වායු ගෝලයේ ඇති ප්‍රධාන වායු වර්ග සංයුතිය අනුව දක්වා, එහි වැදගත්කම කරුණු තුනක් ඇසුරින් පහදන්න. (ලකුණු 10)

**05.** i. ශ්‍රී ලංකාවේ "සාපේක්ෂ" හා "නිරපේක්ෂ" පිහිටීම කෙටියෙන් පහදන්න. (ලකුණු 04)

ii. ශ්‍රී ලංකාවේ දේශගුණය හැඩගැසීම කෙරෙහි පිහිටීම බලපා ඇති අයුරු පහදන්න. (ලකුණු 06)

iii. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන පස් වර්ග හතරක් දක්වා පස නිර්මාණය වන ආකාරය කෙටියෙන් පහදන්න. (ලකුණු 10)

**06.** පහත දැක්වෙන සංකල්ප පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. අක්ෂාංශ

ii. ඍතු භේදය

iii. ශිලා ගෝලය

iv. පෘථිවි භ්‍රමණය

(ලකුණු 5x4=20)

**07.** පහත ස්ථාන ලෝක ආකෘති සිතියමක ලකුණුකර නම් කරන්න.

i. පෝක් සමුද්‍ර සන්ධිය

ii. අත්ලාන්තික් සාගරය

iii. මාලදිවයින

iv. හිමාලය කඳු වැටිය

v. අප්‍රිකා මහද්වීපය

vi. බෙංගාල බොක්ක

vii. මධ්‍යධරණී මුහුද

viii. පංචමහා විල්

ix. හොවැංහෝ ගඟ

x. දකුණු ඇමරිකා මහද්වීපය

(ලකුණු 2x10=20)

The National e-learning Portal for The General Education